# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,875/4 — 1969 ඔක්තෝබර් 14 වැනි අඟහරුවාද — 1969.10.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

1969 ජුලි 11 වැනි දිනැති අංක 14861/7 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද විදුලි බල පනත යටතේ 1969 ජුලි 11 දිනති මගේ නිවේදනය සම්බන්ධවයි. එම නිවේදනයේ 566/17 වැනි පිටුවට අදාලව පහත දැක්වෙන නිවැරදි කිරීම පොදු දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

1969 ඔක්තෝබර් මස 13 වෙනි දින,
කොළඹ 1.

### නිවැරදි කිරීම

පො. ක. ගා. 1 වන ගාස්තුව—කිලෝවෝට්—ඇම්පියර 25 ට වැඩි නොවූ නිර්ණිත අවශ්‍යතාව—අඩුම ගාස්තුව—යටතේ දැක්වෙන ''රු. 25 ක'' යන වචන හා ඉලක්කම් මෙයින් ඉවත්කර ඒ වෙනුවට ''රු 10ක'' යන වචන හා ඉලක්කම් යොදනු ලැබේ.

10—840

---

## මිල පාලන දැන්වීම්

සී. 474 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය ධාන්‍ය ඇට වර්ග,

### මිළ පාලන පනත

#### නියෝගය

දිවයිනේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් දෙවුන්දර ලියනගේ චන්ද්‍රසේකර වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව මෙම නියෝගයෙන් පහත සඳහන් නියමයන් කරමි.

(1) 1969 සැප්තැම්බර් 21 වෙනි දින අංක 14,872/2 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 සැප්තැම්බර් 21 වෙනි දින අංක සී. 473 දරණ ආහාර මිළ නියෝගය මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලෙඛණයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යයක් මෙරටට ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දලබර හොණ්ඩරයක් ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළබර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා —

(අ) උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලෙඛණයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයිඅන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්:

(ආ) උපලේඛණයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිල ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම්:—

(අ) විකුණූ දිනය:

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි):

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල :

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම් වෙළඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව ද නියම කරමි.

(8) උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, උපලෙඛණයේ 2 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බව ද නියම කරමි.

1969 ඔක්තෝබර් 14 වෙනි දින පරවරු 11ට කොළඹ දී අත්සන් කරන ලදී.

ඩී. ඇල් වදුසේකර,
නියෝජ්‍ය මිල පාලක (ආහාර්)

## උපලේඛනය

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>මෙරටට ගෙන්වන්නෙකු විසින් දළ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| චින්තාමනී කඩල ... ... ... | 46 0 ... | 47 75 ... | 0 50 |
| කඩල පරිප්පු ... ... ... | 58 0 ... | 59 75 ... | 0 61 |
| මුං ඇට ... ... ... | 54 50 ... | 56 25 ... | 0 58 |
| උඳු පරිප්පු ... ... ... | 67 50 ... | 69 25 ... | 0 70 |
| සියලි නොකළ උඳු ... ... ... | 52 75 ... | 54 50 ... | 0 56 |
| කෝර පරිප්පු ... ... ... | 66 0 ... | 67 75 ... | 0 68 |
| කොණ්ඩ කඩල ... ... ... | 46 0 ... | 47 75 ... | 0 50 |

සැලකිය යුතුයි.—(1) මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නො හැකිය.

(2) මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.